රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2013

මගේ අංකය: PSC/EST/1/7/1/2011
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177, නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 05.

2013 දෙසැම්බර් මස 18 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>බඳවා ගැනීමේ පරිපාටිවල සහ සේවා ව්‍යවස්ථාවල සඳහන් සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධිවිධාන පිළිබඳව තීරණය කිරීම.</u>**

අංක අමප/12/1542/504/142 හා 2012.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව යථෝක්ත කරුණු පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක්, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුයැයි අමාත්‍ය මණ්ඩලය විසින් 2013.10.03 දිනැතිව තීරණය කරනු ලැබ ඇත.

(I) දැනට අනුමත කර ඇති සියලුම බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථාවල සඳහන් සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධිවිධාන අනුව කටයුතු කිරීම තාවකාලිකව අත්හිටුවිය යුතුය;

(II) අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බඳවා ගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථාවල් සඳහන් සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් නොකළ යුතුය.

02. ඒ අනුව, දැනට අනුමතකර ඇති සියලුම බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථාවල සඳහන් වන සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධිවිධාන අනුව කටයුතු කිරීම තාවකාලිකව අත්හිටුවීමටත්, මින් ඉදිරියට බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථා කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමට අදාළ විධිවිධාන ඊට ඇතුළත් නොකිරීමටත් පියවර ගන්නා ලෙස දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.එම්.එල්.සී.සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් : අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
ආයතන අධ්‍යක්ෂ ජනරාල්
ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව